වයස අවුරුදු 16 ට අඩු ඕනෑම අයෙකු බාලවයස්කරුවෙකු/බාලවයස්කාරියක ලෙස හැඳින්වෙන අතර, එසේ බාලවයසේ පසුවන අයෙකුගේ කැමැත්ත ඇතිව සිදුවන ලිංගික සබඳතාවයක් වුවත්, නීතිය ඉදිරියේ එය සැලකෙන්නේ දඬුවම් ලැබිය හැකි වරදක් වන ලිංගික අපයෝජනයක් ලෙසිනි.

කෙසේ නමුත්, බාලවයස් දැරියක නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීමක් සහ ලිංගික අපයෝජනයට ලක් කිරීමේ සිදුවීමක් දිවයින පුවත්පත (ජූනි 24, 2022) වාර්තා කරන්නේ, "දැරිය තරුණියක් කළ තරුණයා පොලිස් ගැටේ හිරවෙලා" යන සිරස්තලය සමගිනි. එසේම, පුවත් අන්තර්ගතය තුළ මෙය "දූෂණයක්" ලෙසින් දක්වා තිබේ.

1) බාලවයස් දැරියක නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කොට ලිංගික අපයෝජනයට ලක් කිරීමේ සිදුවීමක්, "දැරිය තරුණියක් කිරීමක්" බවට ලඝු කොට වාර්තා කිරීම කෙතරම් වගකීම් සහගත මාධ්‍යකරණයක් ද?

2) මෙවැනි වාර්තාකරණයන් ඔස්සේ, ලිංගික අපයෝජනයක ඇති බරපතලකම සැහැල්ලු කොට දැක්වීමක් සිදු නොවන්නේ ද? ඒ ඔස්සේ, එවැනි සිදුවීම් සාමාන්‍යකරණය වීමටද සහායක් නොලැබෙනු ඇතිද?

3) එසේම, ලිංගික අපයෝජනයට මුහුණ දුන් දැරිය අපවිත්‍ර වූ බවක් හැඟවෙන "දූෂණය" යන යෙදුම වෙනුවට, ලිංගික අපයෝජනය යන්න වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

ලිංගික අපරාධයන් සරල කොට දක්වා වාර්තා නොකරමු!